# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2388/02 - 2024 ජුනි මස 10 වැනි සඳුදා - 2024.06.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත ( 460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DNK/LND1/DEACQ/12/09.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2016/HA/378.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සෙන්දිරියාමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ පිඹුරු අංක ක.සි. 410509 හා 2024.02.28 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0065 ක් පමණ වන සෙන්දිරියාමුල්ල වත්ත නැමති ඉඩම් කැබැල්ල:

01. කැබලි අංක **01**
ඉඩමේ නම: සෙන්දිරියාමුල්ල වත්ත; හිමිකම් කියන අය: තෙන්නකෝන් හලුගේ රොසලින්; ප්‍රමාණය: හෙක්. 0.0065.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 ජූලි මස 15 දින පූ.භා. 10.30 ට දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024 ජූලි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජේ. ඒ. විජානි වසන්තිකා,
ප්‍රාදේශීය ලේකම්,
දන්කොටුව.

2024 ජුනි මස 05 වැනි දින,
දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0072

1A - G 042053 – 36 (2024/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/MDB/4/2/1/248.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2020/WS/97.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ අංක 2363/06 හා 2023.12.18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 3ඒ පිටුවේ සඳහන් ක.සි. 320896 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ඉඩමේ ප්‍රමාණය පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ඉඩමේ ප්‍රමාණය - හෙක්ටයාර් 0.2529 (රූඩ් 2, පර්චස් 20).

නුවන් සී. හේමකුමාර,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2024 අප්‍රේල් මස 30 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0073

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 4/1/ඉ/අත්පත්/76.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2013/WS/413.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ පළ කරන ලද අංක 2343/27 හා 2023.08.02 දිනැති *ගැසට් පත්‍රයේ* EOG 08 - 0019 දැන්වීම පහත පරිදි සංශෝධනය විය යුතු බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ගැසට් පත්‍රයේ සඳහන් නිම්කම් පරීක්ෂණ දිනය* | *සංශෝධනය විය යුතු පරීක්ෂණ දිනය* |
|---|---|
| 2023.10.16 | 2024.07.08 |
| *ගැසට් පත්‍රයේ ලියවිලි භාර දීමේ දිනය* | *සංශෝධනය විය යුතු ලියවිලි භාර දීමේ දිනය* |
| 2023.10.02 | 2024.07.01 |

ඩබ්. පී. සී. එන්. පතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
මල්ලවපිටිය.

2024 මැයි මස 19 වැනි දින,
මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0074

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : හලි/ප්‍රාලේ/3/2/2/36(1).
(KDS/HAT/4/1/2/AQ/56)
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : එල්ඩී/05/2008/එල්/249.

උක්ත ශීර්ෂ යටතේ 2012 වර්ෂයේ ජූනි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1760/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත දැන්වීමේ 13 වන පේළියේ සඳහන් මැන වෙන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0355 ක් වූ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.0335 ක් ලෙස සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. එම්. කේ. බී. වීරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හතරලියද්ද.

2024 මැයි මස 31 වැනි දින,
හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0075

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.